# 2. ජාතික ආදායම හා වියදම

## 2.1 සමස්ත උපනතීන්

1996 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 3.8 කින් වර්ධනය විය. මෙය පසුගිය වසර පහේ සාමාන්‍ය වර්ධන අනුපාතිකය වූ සියයට 5.5 හා සසඳන කළ අඩු වර්ධනයකි. මෙම පසුබෑසීමට බලපෑ මූලික සාධකය වූයේ කෘෂිකර්මය, විදුලිබල උත්පාදනය සහ කාර්මික නිෂ්පාදනය කෙරෙහි අයහපත් ලෙසින් බලපෑම් ඇතිකල කල් පැවති නියගයයි. 1995 වර්ෂයේදී පැවති සතුටුදායක තත්ත්වයට පටහැනිව, ආයෝජන ආදායම් ලැබීම් පහත වැටීම නිසා සහ විදේශ ණයවලට කළ පොලී ගෙවීම් ඉහළ යාම නිසා විදේශීය ශුද්ධ සාධක ආදායම පහත වැටුනු බැවින්, දේශීය නිෂ්පාදිතයට විදේශීය ශුද්ධ සාධක ආදායම එකතු කිරීමෙන් ගණනය කරන, දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) 1996 දී වර්ධනය වූයේ සියයට 3.1 කින් පමණි. ආයෝජන ආදායම් ලැබීම් අඩුවීමට හේතුවූයේ 1995 සහ 1996 වර්ෂවල පැවති ගෙවුම් ශේෂ හිගයන් නිසා පහත වැටුනු ජාත්‍යන්තර සංචිතයන් හා ජාත්‍යන්තර පොලී අනුපාතිකයන් හි සිදුවූ අඩුවීමයි.

පවත්නා වෙළඳපල මිළ ගණන් අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 768,934 ක් වශයෙන් ඇස්තමේන්තු කොට ඇත. මැදි වසර ජනගහනය, සියයට 1.1 ක ඉහළ යාමක් දක්වමින් දසලක්ෂ 18.315 ලෙසින් ඇස්තමේන්තු කර ඇති අතර, ඒ අනුව ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 1996 වර්ෂයේදී රුපියල් 41,984 ක් (ඇමෙරිකානු ඩොලර් 760 ක්) දක්වා වැඩි වී ඇත. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය අනුව බලන විට ශ්‍රී ලංකාව මධ්‍යම ආදායම් ලබන කාණ්ඩයේ සංවර්ධනය වන රටක් ලෙස හැඳින්වීමේ එළිපත්ත මතට පිවිස ඇත. මෙය ආධාර දෙන රටවලින් ඉතා සහනදායී පදනමක් යටතේ ලබන අනුග්‍රහයන්ගෙන් ක්‍රමයෙන් ඈත්වී, සිය අනාගත ආයෝජනයන් උදෙසා ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපල වැනි අනෙකුත් මූලාශ්‍ර මත යැපීමේ අවස්ථාවක් එළඹෙන බවට කල් ඇතිව කෙරෙන සංඥාවක් වෙයි .

1996 වර්ෂයේ ආර්ථික ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා ආර්ථිකයට පහසුවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට ඇති හැකියාව පිළිබිඹු කරයි. වර්ෂයේ මුල් භාගයේ දී සාපේක්ෂ වශයෙන් අඩු නිෂ්පාදන මට්ටමක සිටි ශ්‍රී ලංකා ආර්ථිකය සීග්‍රයෙන් ප්‍රකෘති තත්ත්වයට ළඟාවීමක් වර්ෂයේ අග භාගයේදී දැකිය හැකි විය. කාර්මික නිෂ්පාදනය වඩාත් වේගයෙන් ප්‍රකෘතිමත් ස්වභාවයකට පත්වීමෙන් මෑත වර්ෂවලදී අත්විඳි වර්ධන තත්ත්වයට සමීප වන්නට හැකි විය. එමෙන්ම එළවළු හා සුළු අපනයන භෝග නිෂ්පාදනය ද සැලකිය යුතු වර්ධනයක් පෙන්විය. කොළඹ නගරයේ කෙරුණු ත්‍රස්තවාදී ක්‍රියාවන් නිසා බිඳවැටුණු ආයෝජක මානසිකත්වය, රජය විවෘත හා වෙළඳපල හිතකර ප්‍රතිපත්තීන් ස්ථිරසාර ලෙසින් ක්‍රියාත්මක කිරීම නිසාත්, පෞද්ගලිකරණ වැඩ සටහන අඛණ්ඩව පවත්වා ගැනීම හා දැරිය නොහැකි පාරිභෝජන සහනාධාර ඉවත් කිරීම නිසාත් ඉතා ඉක්මණින් ප්‍රකෘති තත්වයට පත්විය. මෙම පියවරයන් ද සාපේක්ෂව ස්ථාවරව පැවති දේශීය මූල්‍ය හා විනිමය වෙළඳපල වල ක්‍රියාකාරීත්වයද, දේශීය හා විදේශීය යන දෙපක්ෂයේම ආයෝජන වාතාවරණය කෙරේ හිතකර බලපෑම් ඇති කරන්නට සමත් විය.

නිමැවුම් කර්මාන්ත අංශය ආර්ථිකයෙහි ප්‍රධාන අංශය වශයෙන් මෑත වර්ෂවලදී ඉස්මතුව ඇත. 1995 වර්ෂයේ දී ප්‍රථම වතාවට දළ දේශීය නිෂ්පාදිතයට නිමැවුම් කර්මාන්ත අංශය විසින් එකතු කරන ලද වටිනාකම කෘෂිකාර්මික අංශයේ දායකත්වය අභිබවා ගියේය. 1995 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට නිමැවුම් කර්මාන්ත අංශයෙන් කෙරුණු දායකත්වය සියයට 20.7 ක් වූ අතර, මෙම අංශයේ මූර්ත එකතු කළ වටිනාකමෙහි වර්ධනය එම වසරේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයෙන් තුනෙන් එකකට ආසන්න විය. 1996 දී නිමැවුම් කර්මාන්ත අංශයේ මූර්ත වර්ධනය සියයට 6.5 ක් වූ අතර, සමස්ත ආර්ථික වර්ධනයට එහි දායකත්වය සියයට 44 දක්වා ඉහල ගියේය. කර්මාන්ත නිෂ්පාදන පමණක් 1996 වර්ෂයේ ආර්ථික වර්ධනයට කළ දායකත්වය සියයට 40 ක් විය. රෙදිපිළි හා ඇඟලුම් අපනයනයන්, ආහාර හා පාන වර්ග, රබර් නිෂ්පාදන, පිඟන් භාණ්ඩ හා ආභරණ වැනි නිෂ්පාදනයන් මූලික කොටගත් කර්මාන්ත නිෂ්පාදනයන්හි නිෂ්පාදනය 1996 දී සියයට 7.3 ක වර්ධනයක් වාර්තා කළේය. 1996 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් සියයට 73 ක් සමන්විත වූයේ කාර්මික අපනයනයන්ගෙනි.

නිමැවුම් කර්මාන්ත අංශය හා කෘෂිකාර්මික අංශය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් පවතී. තේ, රබර් හා පොල් මද නිෂ්පාදන සැකසීමේ අංශයෙහි ක්‍රියාකාරීත්වය තීරණය කරන්නේ වැවිලි භෝගයන්ගේ නිෂ්පාදනය මගිනි. ආර්ථිකයෙහි අනෙකුත් අංශයන්හි වන වර්ධනයත් සමග දේශීය නිෂ්පාදිතයට මෙම ක්‍රියාකාරකම් මගින් ලැබෙන සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. අනෙකුත් කෘෂි නිෂ්පාදිතයන් සැකසීම ශ්‍රී ලංකා ආර්ථිකයේ ගතික කර්මාන්තයක් වන අතර, එවැනි ඇතැම් ක්‍රියාකාරකම් සිය නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපනයනය කරමින් දැනටමත් උසස් මට්ටමකට සංවර්ධනය වී ඇත. මෙවැනි ඇතැම් කර්මාන්තයන්ද 1996 වර්ෂයේ පැවති නියගය නිසා පීඩාවට පත්විය. නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ වටිනාකමෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයකින් දායක වන ආහාර, පාන වර්ග හා දුම්කොළ උප අංශයට සිය අමුද්‍රව්‍ය අවශ්‍යතා උදෙසා කෘෂි අංශය මත යැපීමට සිදුවෙයි. එම නිසා, කෘෂිකාර්මික අංශයේ ව්‍යාප්තිය නිමැවුම් කර්මාන්ත අංශයේ වර්ධන ක්‍රියාවලියට ඉඩ ප්‍රස්ථා සලසයි. අවම හා ඒකීය තීරු බදු ව්‍යුහයක් තබාගැනීමේ අරමුණින් වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තීන් ඉදිරියට තවදුරටත් තාර්කිකරණය කෙරෙනු ඇති බැවින් නිමැවුම් කර්මාන්ත අංශය ගුණාත්මකභාවය හා ඵලදායිතාවය යන අංශයන්ගෙන් වඩාත් තරගකාරී වීම අත්‍යවශ්‍ය කරුණක් වෙයි.

1996 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතය මධ්‍යස්ථ වර්ධන වේගයක් වාර්තා කිරීමට හේතු වන්නේ එම වසරේ දිගු කාලයක් පුරා පැවති නියගය හේතුවෙන් කෘෂිකර්මය, දැව හා ධීවර ආදී අංශයේ සිදුවූ පසුබෑමයි. 1995 වර්ෂයේදී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 20.3 නියෝජනය කළ මෙම අංශය, එම වසරේ වර්ධනයෙන් සියයට 11.4 කට දායක විය. 1995 වර්ෂයේදී සියයට 3.3 කින් වර්ධනය වුනු මෙම අංශයෙහි එකතු කළ වටිනාකම ඊට ප්‍රතිමුඛව 1996 දී සියයට 4.6 ක පහත වැටීමක් පෙන්විය. කෘෂිකාර්මික අංශයෙහි වී උප අංශය සියයට 26.7 ක තියුණු අඩුවීමක් වාර්තා කළේය. 1995 වර්ෂයේදී වාර්තාගත වී අස්වැන්නක් ලැබීම නිසා මෙට්‍රික් ටොන් 9,460 කට සීමා වූ සහල් ආනයනය, මහ, යල දෙකන්නයම අසාර්ථක වීම නිසා 1996 දී මෙට්‍රික් ටොන් 341,200 ක් දක්වා ඉහල යාම නොවැලැක්විය හැකි විය. 1995 දී ගෙඩි දශලක්ෂ 2,755 ක් වූ පොල් නිෂ්පාදනය, 1996 වර්ෂයේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන් යටතේ සියයට 7.6 කින් පහත වැටුනේ ය.

තේ නිෂ්පාදනය සියයට 5.1 කින් ඉහල යාමට සම්පූර්ණයෙන්ම හේතුවූයේ පහත් බිම් තේ වගාවේ වූ ව්‍යාප්තියයි. මෑත වර්ෂවලදී ඉතා හිතකර අන්දමින් ඉහල ගිය පහත් බිම් තේ නිෂ්පාදනය 1966 දී මුළු තේ

**සංඛ්‍යා සටහන 2.1**

**ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය**

| අංශ | වැඩිවීමේ අනුපාතය % | | දළ.ජා.නි.හි වැඩිවීමෙහි ප්‍රතිශතක දායකත්වය | | දළ.ජා.නි.හි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | 1995(අ) | 1996(අ) | 1995(අ) | 1996 (අ) | 1995(අ) | 1996 (අ) |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 3.3 | -4.6 | 11.4 | -30.0 | 20.3 | 18.8 |
| කෘෂිකර්මය | 3.3 | -5.1 | 9.7 | -28.3 | 17.2 | 15.8 |
| තේ | 1.6 | 5.1 | 0.5 | 3.1 | 1.9 | 1.9 |
| රබර් | 0.9 | 6.3 | 0.1 | 0.9 | 0.4 | 0.4 |
| පොල් | 5.1 | -7.6 | 1.8 | -5.2 | 2.1 | 1.9 |
| වී | 4.7 | -26.7 | 3.4 | -36.6 | 4.3 | 3.0 |
| අනෙකුත් | 2.6 | 3.5 | 3.8 | 9.5 | 8.5 | 8.5 |
| දැව ආදී වන ද්‍රව්‍ය | 1.2 | 1.3 | 0.3 | 0.5 | 1.3 | 1.3 |
| ධීවර | 4.9 | -3.9 | 1.5 | -2.3 | 1.8 | 1.7 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 3.4 | 8.9 | 1.4 | 7.0 | 2.4 | 2.6 |
| 3. නිමැවුම් කර්මාන්ත | 9.2 | 6.5 | 30.8 | 43.5 | 20.7 | 21.4 |
| තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | 4.4 | 1.0 | 1.7 | 0.7 | 2.2 | 2.2 |
| නිෂ්පාදන කර්මාන්ත | 10.0 | 7.3 | 27.5 | 39.9 | 17.0 | 17.7 |
| කුඩා කර්මාන්ත | 7.1 | 6.3 | 1.7 | 2.9 | 1.5 | 1.5 |
| 4. ඉදිකිරීම් | 4.9 | 3.4 | 5.8 | 7.6 | 7.0 | 7.0 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 10.2 | -2.0 | 2.6 | -1.0 | 1.6 | 1.5 |
| විදුලිය | 9.7 | -3.8 | 2.2 | -1.7 | 1.4 | 1.3 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම හා සංනිවේදනය | 5.5 | 7.5 | 10.5 | 27.3 | 11.3 | 11.8 |
| සංනිවේදනය | 14.1 | 25.2 | 2.4 | 9.0 | 1.1 | 1.3 |
| 7. තොග සහ සිල්ලර වෙළඳාම | 3.6 | 5.2 | 13.3 | 36.0 | 21.6 | 22.1 |
| ආනයන | 2.1 | 7.4 | 3.3 | 21.5 | 9.0 | 9.4 |
| අපනයන | 12.6 | 8.2 | 6.4 | 8.5 | 3.2 | 3.4 |
| දේශීය | 2.2 | 2.0 | 3.6 | 6.0 | 9.4 | 9.3 |
| 8. බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල | 10.5 | 10.1 | 9.9 | 19.0 | 5.9 | 6.2 |
| 9. නිවාස අයිතිය | 1.3 | 1.3 | 0.5 | 1.0 | 2.4 | 2.3 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 5.4 | 5.0 | 4.0 | 7.0 | 4.4 | 4.4 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 4.5 | 4.0 | 2.9 | 4.8 | 3.8 | 3.8 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 5.5 | 3.8 | 93.1 | 122.3 | 101.2 | 101.9 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | - | - | 6.9 | -22.3 | -1.2 | -1.9 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 6.0 | 3.1 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදනයෙන් අඩකට වඩා හිමිකම් කීවේය. 1996 වර්ෂයේදී රබර් නිෂ්පාදනය සියයට 6.3 කින් ඉහල ගියේය. රබර් මිළගණන් තවදුරටත් ආකර්ෂණීය තත්ත්වයක පැවති මුත්, රබර් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල ඇති වූ නිෂ්පාදන වර්ධනය හේතුවෙන්, පසුගිය වර්ෂයේ පැවති ඉහළම මිල ගණන් සමග සසඳද්දී අඩු මට්ටමක පැවතිණ. "අනෙකුත් කෘෂිකාර්මික" උප අංශය, එළවළු, පළතුරු, සුළු අපනයන භෝග හා කිරි වැනි අයිතමයන්ගේ නිෂ්පාදනය ඉහලයාම හේතුවෙන් සියයට 3.5 ක මධ්‍යස්ථ වර්ධනයක් සළකුණු කළේය. මුළු මත්ස්‍ය සැපයුමෙන් සියයට 90 කට පමණ දායක වන මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය වර්ෂයේ දෙවෙනි කාර්තුවේදී පැවති අයිස් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් පහත වැටුනි.

කෘෂිකාර්මික අංශයෙන් සමස්ත ආර්ථිකයට කෙරෙන දායකත්වය අඩුවීම සැලකිය යුතු කරුණකි. ශ්‍රී ලංකා ජනගහනයෙන් ඉතා විශාල ප්‍රමාණයක් ග්‍රාමීය අංශයේ ජීවත්වන බැවින්, කෘෂිකාර්මික අංශය වඩාත්

## හරිත ජාතික ගිණුම්

**විශේෂ සටහන 2**

සිග්‍ර ආර්ථික සංවර්ධනය විසින් ස්වාභාවික සම්පත් සහ පරිසරය වෙත කෙරෙන අයහපත් බලපෑම පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය වඩ වඩා යොමුවෙමින් තිබේ. තම රටෙහි ස්වාභාවික සම්පත් සහ පරිසරය කැපකරමින් සීග්‍ර ආර්ථික වර්ධනයක් හිමිකරගත් රටවල් තිබේ. එවැනි සංවර්ධනයක් දිගුකාලීනව පවත්වා ගත නොහැකි බව පෙනෙයි. ඊට හේතුව එසේ විනාශ කෙරෙන සම්පත් අනාගතයේදී ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වා ගැනීමට යොදාගත නොහැකි වීමයි. ඒ අතරම, පරිසරය විනාශ කිරීම සමාජයේ ජීවන තත්ත්වය පහත දැම්මක්ද වෙයි. මේ නිසා ආර්ථික වර්ධනය සහ ස්වභාවික සම්පත් හා පරිසර රක්ෂණය තවදුරටත් එකිනෙකින් දුරස්තර ප්‍රතිපත්තීන් දෙකක් නොවන අතර, ඒවා ආර්ථික සංවර්ධනයට අවශ්‍ය අන්‍යෝන්‍ය බැඳුනු සාධකයන් දෙකක් වෙයි. හරිත ජාතික ගිණුම් සංකල්පය ගොඩනැගෙනුයේ මෙම මතවාදයන්හි ප්‍රතිඵලයක් ලෙසිනි.

හරිත ජාතික ගිණුම් කරණයේදී, දළ ජාතික නිෂ්පාදිතය සහ ආර්ථික සුභසාධනය වැනි ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරීත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වර්තමානයේ නිර්දේශිත, ජාතික ගිණුම් ක්‍රමය ක්‍රියාකාරීත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වර්තමානයේ නිර්දේශිත, ජාතික ගිණුම් ක්‍රමය කිසියම් නවීකරණයකට භාජනය කරයි. හරිත ජාතික ගිණුම්කරණයේදී ආර්ථික ක්‍රියාවන් නිසා ස්වාභාවික සම්පත් අහිමිවීමත්, පරිසරයට සිදුවන හානියත් ගණනය කෙරෙයි. මෙම පරිසර සාධකය ගැලපූ දර්ශකයන්, උදාහරණ වශයෙන් කිසියම් වර්ෂයක ස්වාභාවික සම්පත් වලට හා පරිසරයට සිදුවන හානිය අඩුකොට ගණනය කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අගයන්, රටක ආර්ථික ක්‍රියාකාරීත්වය පෙන්වන වඩා හොඳ දර්ශකයන් ලෙස සැලකේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංඛ්‍යාන අංශය පරිසර සාධකය එකතුකොට ගත් නව ක්‍රමයක් පවත්නා ජාතික ගිණුම් ක්‍රමයට එකතු කිරීමට කටයුතු යොදමින් සිටී. සම්මත ආදායම් ගිණුම් හා ශේෂ පත්‍රයන් මෙම නව ක්‍රමයට එකතු කිරීමට කටයුතු යොදමින් සිටී. සම්මත ආදායම් ගිණුම් හා ශේෂ පත්‍රයන් මෙම නව ක්‍රමයට සැකසෙනු ඇත. මෙහි ප්‍රථම පියවර වන්නේ සෑම රටක් සඳහාම ඒ රටේ ප්‍රමාණාත්මකව මිණුම් කරන ලද සියළුම ස්වාභාවික සම්පත් ඇතුලත් විස්තරාත්මක ලේඛණ පිළියෙල කිරීමයි. සියළුම රටවල් සඳහා කළ නොහැකි වුවත්, සමහරක් රටවල් සඳහා ඒ රටවල ඇති ස්වාභාවික සම්පත් තොගය වෙනුවෙන් කිසියම් මුදල්මය වටිනාකමක් ආරෝපණ කිරීම කළ හැකි වෙයි. මේ තුළින් පරිසරයේ ගුණාත්මක භාවයේ පරිහාණියක් ඇති කරමින්, ස්වාභාවික සම්පත් හි සිදුවන අඩුවීම මුදල්මය අගයකින් ඇස්තමේන්තු කළ හැකි වෙයි. මෙවැනි ඇස්තමේන්තු කිරීම් කළ විට, පරිසරයට හිතකර නොවන නිෂ්පාදන හා පරිභෝජන රටාවන් හඳුනාගත හැකි අතර, ඒ ඔස්සේ දිගුකාලීන නොවන සංවර්ධනයකට මග පෙන්වන ආර්ථික වර්ධනයන් කෙරෙහි අනතුරු ඇඟවීම් කළ හැකි වෙයි.

1977 පසුකාලයේදී ශ්‍රී ලංකා ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 4.5 ක වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතිකයක් වාර්තා කර ඇත. ඊට අනුරූප වන පරිදි නාගරික හා ග්‍රාමීය අංශයන්හි පරිසර ප්‍රශ්න උද්ගතව ඇති බව පැවසෙයි. නාගරික කරණය හා කාර්මික කරණය වාතය සහ ජලය දූෂිත කරන්නට හේතු වී ඇති අතර එය කාර්මික නගරයන්හි වෙසෙන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන්හි පරිහාණියට හේතුවෙයි. ග්‍රාමීය අංශයන්හි වැඩිවන ජනගහනය නිසා සීමිත ස්වභාවික සම්පත්වලට ඔරොත්තු නොදෙන ඉල්ලුමක් ඇති වී තිබේ. දර භාවිතයත්, කැලෑ කපා දමමින් කෙරෙන කෘෂිකාර්මික කටයුතුත් වනාන්තරවලට බලවත් හානි සිදුකර ඇති අතර, එය වනගහණය අඩු කිරීමටත්, පස නිසරු කිරීමටත් හේතු වී තිබේ. ඛණිජ සම්පත්, අඩු එකතු කළ වටිනාකමක් යටතේ අපනයනය කිරීමේ අරමුණින් විනාශයට හෙළනු ලැබ තිබේ. ශ්‍රී ලංකාවට හරිත ජාතික ගිනුම් ක්‍රමයක් පිළියෙල කිරීම සඳහා ස්වාභාවික සම්පත් සහ පරිසර විනාශය පිළිබඳ දත්ත එකතු කිරීම පූර්ව අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන ගණනාවකම සහයෝගයද අවශ්‍ය වේ.

ගතික අංශයක් බවට පරිවර්තනය කිරීම සඳහා එම අංශයෙහි, විශේෂයෙන්ම වැවිලි භෝග අයත් නොවන සම්ප්‍රදායික කෘෂි අංශයෙහි, ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සුදුසු පියවරයන් සොයාගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන්, පොදු කාර්ය පහසුකම් හා වෙළඳපලවල් සංවර්ධනය කිරීම සහ නව තාක්ෂණය හඳුන්වා දීම දිරිගන්වන අඛණ්ඩ ප්‍රතිපත්ති ගොනුවක් අවශ්‍ය වෙයි.

ආර්ථික වර්ධනයට, කෘෂිකාර්මික අංශයෙන් සිදු කරන දායකත්වයේ වූ තාවකාලික පසුබෑසීම හේතුවෙන්, සේවා අංශයේ වැදගත්කම 1996 වර්ෂයේදී කැපී පෙනුණි. පසුගිය වසරේ සියයට 51.0 ක් වූ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට සමස්ථ සේවා අංශයෙන් වූ දායකත්වය, 1996 දී සියයට 52.1 ක් වශයෙන් සුළු වර්ධනයක් සළකුණු කළේය.

සේවා අංශයේ වර්ධනයට උරදුන්නේ තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, ගබඩා කිරීම හා සංනිවේදනය සහ බැංකු රක්ෂණ හා නිශ්චල දේපල යන උප අංශයන්ගෙන් සිදු වූ ප්‍රසාරණයයි. දළ ජාතික නිෂ්පාදිතයේ සියයට 22.1 කට දායක වුනු තොග හා සිල්ලර වෙළඳාම මෙම වසරේදී ද නොවෙනස්ව, ආර්ථිකයේ ප්‍රධානතම අංශය ලෙසින් සිටී. මෙම අංශයේ ඉහල වර්ධන අනුපාතිකයන් වාර්තා වූයේ ආනයන වෙළඳාමෙහි ඇති වූ ව්‍යාප්තිය හේතුවෙනි.

සේවා අංශයේ විශිෂ්ඨතම ක්‍රියාකාරීත්වය දැකිය හැකි වන්නේ ප්‍රවාහන, ගබඩා කිරීම හා සංනිවේදන යන උප අංශයෙහිය. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ හා පෞද්ගලික අංශයේ සංවර්ධන ව්‍යාපෘතීන් මෙම වර්ධන ක්‍රියාකාරීත්වයට ප්‍රධාන හේතුව වෙයි. එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය නවීකරණය කිරීමේ හා ව්‍යාප්තිකරණය කිරීමේ විවිධ ව්‍යාපෘතීන්හි කටයුතු සම්පූර්ණ වීමත්, කොළඹ වරාය හරහා කෙරෙන නෞකා ගමනාගමනය ඉහළයාමත් මේ අංශයේ වර්ධනයට දායක වූයේය. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා උප අංශය හැරුණු කොට, සේවා අංශයේ අනෙකුත් උප අංශයන්ද 1996 දී එකතු කළ වටිනාකමෙහි වර්ධකයන් පෙන්වීය. එසේ වුවද, එම අනෙකුත් උප අංශයන්ගේ වර්ධන වේගයන් 1995 දී සලකුණු කළ අනුපාතිකයන් හා සසඳද්දී අඩු මට්ටමක පවතින බැවින්, එම උප අංශයන් පෙන්නුම් කරන්නේ වර්ධනයේ අඩු වීමකි. ඒවා අතුරින් පසුගිය වසරේ සියයට 10.5 කින් වර්ධනය වුනු බැංකු, රක්ෂණ හා නිශ්චල දේපල උප අංශය ආන්තික අඩුවීමක් සලකුණු කරමින් මෙම වසරේ වර්ධනය වන්නේ සියයට 10.1 කිනි. මෙම අංශයේ වාණිජ බැංකු කරණය හා රක්ෂණය වැනි උප අංශයන් සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක වෙමින් වර්ධනයට දායක වුනු නමුදු, කල්බදු හා නිශ්චල දේපල වැනි උප අංශයන්ගේ ක්‍රියාකාරීත්වයෙහි පසුබෑසීමක් දක්නට ලැබුනි.

1996 වර්ෂයෙහි පැවති නියගය හේතුවෙන් විදුලිබල උත්පාදනය පහත වැටුනු අතර, එය විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා යන අංශයේ සියයට 2 කට ඍණ වර්ධනයට හේතු විය. මෙමගින් පෙන්නුම් කරන්නේ ජල විදුලි උත්පාදනය මත රැඳී සිටීම අඩු කොට අනෙකුත් විකල්ප විදුලි උත්පාදන ක්‍රම ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවයයි.

ප්‍රාථමික භාණ්ඩ මත ඉතා දැඩිව යැපුණු තත්ත්වයක සිටි ශ්‍රී ලංකා ආර්ථිකය, හිතකර ආර්ථික ලිහිල්කරණයත් සමග ගතික සේවා අංශයත් සමග අත්වැල් බැඳගත් නිමැවුම් කර්මාන්ත අංශය, ගාමක බලවේගය වශයෙන් ක්‍රියාකරණ විවිධාංගීකරණය වූ ආර්ථිකයක් කරා ක්‍රමයෙන් විතැන් වී ඇත. මෙම ව්‍යුහාත්මක වෙනස්වීම්වලට භාජනය වීම නිසාවෙන්, කාලගුණික තත්ත්වයන් හා ප්‍රාථමික භාණ්ඩ මිල ගණන්හි උච්චාවචනය වැනි පාලනයෙන් තොර සිදුවීම් වලින් ශ්‍රී ලංකා ආර්ථිකය පීඩනයට පත් කළ හැකි ප්‍රමාණය අඩු වී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෑත වර්ෂවලදී, ස්ථාවර වර්ධන ගමන් මගක් ඉදි වී තිබේ. මෑත වර්ෂවලදී ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය ඉතාමත් සතුටුදායක වන අතර, පවත්නා පොදු කාර්ය පහසුකම් යටතේ එම වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම අසීරු කරුණක් බව පෙනෙයි. නිෂ්පාදන පිරිවැය පහත හෙළීමටත්, ඵලදායීතාවය ඉහළ නැංවීමටත්, ආර්ථික සංවර්ධනය සැලසීමටත් පොදු පහසුකම් ප්‍රමාණවත් අන්දමින් පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වෙයි. 1996 වර්ෂයේදී මෝසම් වැසි මඳවීමේ හේතුවෙන්, ජාතික බලශක්ති සැපයුමට වැඩිම දායකත්වය සපයන ජල විදුලිබල උත්පාදනය විශාල තර්ජනයකට මුහුණ පෑවේය. විසඳුම් වශයෙන් තමාගේම විදුලි උත්පාදක යන්ත්‍ර පාවිච්චි කිරීම දිරිගැන්වීම සැපයුම පහත වැටීමේ බලපෑම අඩු අතර, නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන්හි නිෂ්පාදන කටයුතු අඩාල වීම ද ඉන් වැලකී ගියේය. කෙසේ වුවත්, නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයේ පෙන්වන වර්ධන උපනතීන් යටතේ, බලශක්ති ඉල්ලුම අඛණ්ඩව ඉහළ තත්ත්වයක පවතිනු ඇත. මෙම තත්ත්වයන් ජයගැනීමට නම්, දීඝකාලීන දැකීමක් සහිත, පොදු කාර්ය පහසුකම් ප්‍රසාරණය කිරීමේ ක්‍රියාකාරී සැලසුමක් අවශ්‍ය වෙයි.

දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල යටතේ රුපියල් බිලියන 685 ක් ලෙසින් 1996 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති අතර, එය 1995 වසරේ වාර්තා වුනු රුපියල් බිලියන 591 හා සසඳන කළ සියයට 15.8 ක වර්ධනයකි. 1995 දී සියයට 8.4 ක්ව පැවති, ආර්ථිකයේ සමස්ත මිල ගණන් වෙනස්වීම් පිළිබිඹු කරන මිණුමක් වන ගම්‍ය මිල දර්ශකය 1996 දී සියයට 12.3 කින් ඉහළ ගියේය. මෙම උපනතිය අනෙකුත් උද්ධමන දර්ශකයන් වන කොළඹ පාරිභෝගික මිල දර්ශකය හා මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ හැසිරීම සමග මනාව සැසඳෙයි.

වියදම් අංශයෙන් බලන කල පවත්නා වෙළඳපල මිල යටතේ දළ දේශීය වියදම රුපියල බිලියන 836 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, 1995 වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 737 සමග සසඳන කළ එය සියයට 13.3 ක ඉහළ යාමකි. සමස්ත වියදමෙන් වැඩිම ප්‍රමාණයකට දායක වන පරිභෝජන වියදමෙහි වර්ධනය 1996 දී සියයට 15 ක් විය. මෙයින් පෞද්ගලික පරිභෝජන වියදම්හි වර්ධනය සියයට 16 ක් වෙයි. කෙසේ වුවත් පසුගිය වසර හා සසඳන කළ රජයේ පරිභෝජන වියදම්හි සැලකිය යුතු පසුබෑමක් පෙනෙයි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 8.4 ක වර්ධනයක් සලකුණු කරමින් රුපියල් බිලියන 186 දක්වා ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර ඇත. ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 1995 වර්ෂයේදී සියයට 25.7 ක් වූ අතර, 1996 වර්ෂයේදී සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් සියයට 24.2 ක් වශයෙන් වාර්තා වෙයි. 1995 වර්ෂයේ රුපියල් බිලියන 102 ක් වූ දේශීය ඉතුරුම් 1996 දී රුපියල් බිලියන 119 දක්වා ඉහළ ගිය අතර, එය දේශීය ඉතුරුකිරීම් අනුපාතයේ සියයට 15.3 සිට 15.5 දක්වා ආන්තික ඉහලයාමකට හේතු විය.

## 2.2 ආංශික ක්‍රියාකාරීත්වය

වර්ෂයේ මුල් භාගය පුරා පැතිරුණු නියගය හේතුවෙන් 1996 වර්ෂයේදී කෘෂිකාර්මික අංශය පසුබැසීමක් පෙන්වයි. පසුගිය වර්ෂයේ සියයට 3.3 කින් වර්ධනය වුනු මෙම අංශය, 1996 දී වාර්තා කරන්නේ සියයට 4.6 ක ඍණ වර්ධනයකි. මෙවැනි නියගයක් හේතුවෙන්, කෘෂිකාර්මික නිෂ්පාදනය අඩාල වුනු 1987 වර්ෂයට පසු, කෘෂිකාර්මික අංශය අඩුම වර්ධන වේගයක් වාර්තා කළේ මෙම වසරෙහිදීය.

කෘෂිකාර්මික අංශයෙහි එකතු කළ වටිනාකමට අනුව වඩාත්ම වැදගත් භෝගය වන වී වගාව අසතුටුදායක කාලගුණික තත්ත්වයන්ට වඩාත් සංවේදී විය. වී නිෂ්පාදනය මහ සහ යල දෙකන්නයෙහිම පිළිවෙලින් සියයට 24 කින් හි සියයට 30 කින් පහත වැටුනු අතර, සමස්ත වී නිෂ්පාදනයේ අඩුවීම සියයට 26.7 ක් විය. නිෂ්පාදන ප්‍රමාණය අනුව සැලකුවහොත්, 1995 වර්ෂයේදී මෙට්‍රික් ටොන් දහස් 2810 ක් වූ වී නිෂ්පාදනය 1996 දී මෙට්‍රික් ටොන් දහස් 2060 දක්වා අඩුවූ අතර, එය 1979 න් පසු වාර්තා වූ අඩුම වී නිෂ්පාදනය විය. නියගය හේතුවෙන් 1995 දී හෙක්ටයාර 915,000 ක්ව පැවති දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය, 1996 දී හෙක්ටයාර 749,000 දක්වා පහත බැස්සේය. දළ වශයෙන් අස්වැන්න කපාගත් බිම් ප්‍රමාණය දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ සාමාන්‍ය වර්ෂයකදී සියයට 85 ක් පමණ වන නමුත්, 1996 වර්ෂයේදී එය සියයට 75 ක් වීම නියගය නිසා වී ගොවීනට සිදුවූ හානිය පිළිබිඹු කරයි. වී වගා කරන සියළුම දිස්ත්‍රික්කවල වගා හානිය දැකිය හැකි වූ අතර, එය කුරුණෑගල, අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව වැනි ප්‍රධාන වශයෙන් වී වගා කෙරෙන දිස්ත්‍රික්කයන්හි සුවිශේෂ විය.

වී නිෂ්පාදනයේ පහත වැටීම සහල් මිල ගණන් හා සහල් ආනයන වලින් පිළිබිඹු කෙරුණි. පසුගිය වසරේ ඉතා අඩු මට්ටමක පැවති සහල් ආනයනය, 1996 දී මෙට්‍රික් ටොන් 341,200 ක් වෙමින් දශකයේ වැඩිම සහල් ආනයන ප්‍රමාණය වාර්තා කළේය. සහල් ආනයනය මෙලෙස සැලකිය යුතු අන්දමින් ඉහළ ගිය නමුත්, සහල් මිල ගණන් අධ්‍යයනයට හසුවන වර්ෂයේදී ඉතා තියුණු අන්දමින් ඉහල ගියේය. සහල් මිල ගණන් ඉහළ යෑමට සහල් සැපයුමේ ඇතිවූ අඩුවීමට අමතරව බලපෑ කරුණක් වූයේ තිරිඟු පිටි සහනාධාරය 1996 දී ඉවත් කිරීම නිසා සහල් හා සහල් නිෂ්පාදන වලට වූ ඉල්ලුම වැඩිවීමයි.

සමස්ථයක් වශයෙන් ගත් කල, සලකා බලන වර්ෂයේදී වතු වැවිලි අංශයේ ක්‍රියාකාරීත්වය සතුටුදායක විය. පසුගිය වසරේ පැවැති ඉහළ නිෂ්පාදන මට්ටම ඉක්මවා යමින් කිලෝග්‍රෑම් මිලියන 258 ක වාර්තාගත මට්ටමකට ළඟාවූ තේ නිෂ්පාදනය, පසුගිය වසරට වඩා සියයට 5.1 ක වර්ධනයක් සළකුණු කළේය. මෙම ඉහළයාම සම්පූර්ණයෙන්ම පැමිණියේ ප්‍රථම වරට මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 50 ඉක්මවා දායක වුනු පහත් බිම් තේ නිෂ්පාදනයෙනි. වර්ෂය පුරා පැවති ආකර්ශණීය මිල ගණන් හා සුළු පරිමාණ නිෂ්පාදකයන්ගේ ඵලදායීතාවය ඉහළයාම මෙම වර්ධනයට දායක වූ කරුණු විය. ඇතැම් වැවිලි සමාගම් නව කළමනාකරණයක් යටතට පත්වීමද, තේ නිෂ්පාදනයෙහි ඵලදායිතාවය ඉහළ යාමෙහි ලා ඉවහල් වූ බව විශ්වාස කෙරේ. පසුගිය වසරේ සාමාන්‍ය වශයෙන් සියයට 12 කින් ඉහළ ගිය

ලෝක වෙළඳපොලේ තේ මිල ගණන් මෙම වසරේ තවදුරටත් සතුටුදායක අන්දමින් වර්ධනය වෙමින් සියයට 43 ක වර්ධනයක් සලකුණු කළේය. පසුගිය වසරේ ආන්තික වර්ධනයක් පෙන්නුම් කළ රබර් නිෂ්පාදනය 1996 දී සියයට 6.3 කින් ඉහළ ගියේය. රබර් මිල ගණන් 1995 වසරට වඩා සියයට 6 ක අඩුවීමක් පෙන්වන නමුදු, පසුගිය වසර කිහිපය තුළ පැවැති මිල හා සසඳද්දී තවදුරටත් හොඳ මට්ටමක පවතින බව පෙනේ. ඉකුත් වසරේ සියයට 5.1 කින් ඉහළ ගිය පොල් නිෂ්පාදනය 1996 දී සියයට 7.6 කින් අඩු විය. 1995 වර්ෂයේ අගභාගයේ ඇරඹුණු නියගයේ පසුකාලීන බලපෑම පොල් නිෂ්පාදනය පහත වැටීමට ප්‍රධාන හේතුව විය.

අනෙකුත් සියළුම භෝග වර්ග සහ සත්ව පාලනය ඇතුලත් වන "අනෙකුත් කෘෂිකාර්මික" අංශය 1996 දී සියයට 3.5 කින් වර්ධනය විය. මෙම ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ එළවළු හා සුළු අපනයන භෝග නිෂ්පාදනයන්ගෙන් ඇතිවූ ප්‍රසාරණයයි. නමුත් අතුරු ආහාර භෝග නිෂ්පාදනය අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ආන්තික අඩුවීමක් පෙන්වීය. මෙම අංශයෙහි රතුළුණු, ලොකු ළූණු, අමු මිරිස්, කුරක්කන් හා මෙනේරි නිෂ්පාදනය පහත වැටුනු අතර, මුං ඇට, කව්පි හා අර්තාපල් නිෂ්පාදනය ඉහළ ගියේය. බීජ ලබා ගැනීමට හැකිවීම නිසාත්, වගා කළ බිම් ප්‍රමාණය ඉහළ යාම නිසාත් අර්තාපල් නිෂ්පාදනයේ වූ ප්‍රසාරණය සුවිශේෂ විය. මීට අමතරව වර්ෂයේ මුල් භාගයේ වාර්තා වුනු සුළු පරිමාණ කුකුළු පාලකයින් සිටින පුත්තලම කුරුණෑගල හා ගම්පහ වැනි දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත වුනු ගම්බරෝ රෝගය නිසා 1996 දී බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනය අඩුවිය.

**සංඛ්‍යා සටහන 2.2**

**අනෙකුත් කෘෂිකාර්මික උප අංශයේ සංයුතිය**

| අංශය | 1982 ස්ථාවර මිල අනුව එකතු කළ වටිනාකම (රුපියල් දශලක්ෂ) | | | |
|---|---|---|---|---|
| | 1993 | 1994(අ) | 1995(අ) | 1996(අ) |
| එළවළු | 5,398 | 5,181 | 5,541 | 5,765 |
| අතුරු ආහාර භෝග (ආ) | 3,435 | 3,602 | 3,673 | 3,687 |
| සුළු අපනයන භෝග (ඇ) | 1,715 | 1,603 | 1,462 | 1,543 |
| උක්ගස් | 221 | 257 | 287 | 279 |
| දුම්කොළ | 261 | 211 | 175 | 169 |
| සත්ව පාලනය (ඈ) | 1,055 | 1,117 | 1,248 | 1344 |
| අනෙකුත් | 1,597 | 1,697 | 1,635 | 1725 |
| එකතුව | 13,681 | 13,667 | 14,021 | 14,512 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) අතුරු ආහාර භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් අර්තාපල්, මිරිස්, රතුළුනු, ලොකුළූණු, මුංඇට, කව්පි, කුරක්කන් ඇතුළු අනිකුත් අතුරු ආහාර භෝග වලින් සමන්විත වේ.
(ඇ) සුළු අපනයන භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් කෝපි, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, කජු, බුලත් හා අනිකුත් සුලු අපනයන භෝග වලින් සමන්විත වේ.
(ඈ) සත්ව පාලන කාණ්ඩය ප්‍රධාන වශයෙන් කිරි, බිත්තර කුකුල් මස් හා අනිකුත් මස් නිෂ්පාදන කටයුතු වල එකතු කළ අගයන් ගෙන් සමන්විත වේ.

පසුගිය වසරේ සියයට 4.9 කින් වර්ධනය වුනු මාළු නිෂ්පාදනයෙහි වූ අඩුවීම ප්‍රාථමික අංශයේ ප්‍රශ්න තවදුරටත් බරපතල කරන්නට හේතු විය. මීට සම්පූර්ණයෙන්ම හේතු වූයේ මුහුදුබඩ හා ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම යන දෙඅංශයෙන් සමන්විත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ අඩුවීමයි. මසුන් ඇල්ලීමට අවශ්‍ය අයිස් හා ඉන්ධන වැනි යෙදවුම්වල ඇතිවූ හිඟය හේතුවෙන් වසරේ දෙවන කාර්තුවේ මත්ස්‍ය නිෂ්පාදනය අඩාල විය. ආරක්ෂක තත්ත්වයේ වූ පිරිහීම හේතුකොට ගෙන උතුරු හා නැගෙනහිර පළාත්වල මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය පහත වැටීමත් මෙම අඩුවීමට හේතු විය. කෙසේ වුවත්, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 11.3 කින් ඉහළ යාම, මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ වූ පහත වැටීම අර්ධ වශයෙන් සමනය කරන්නට හේතු විය.

පසුගිය වසරේ වාර්තා වුනු සියයට 3.4 ක ඉහළ යාම හා සසඳන කල පතල් හා කැනීම් අංශය 1996දී සියයට 8.9 කින් වර්ධනය විය. මේ සඳහා වඩාත් දායක වූයේ පතල් උප අංශයේ වූ ප්‍රසාරණයයි. පතල් අංශයට වැඩිම දායකත්වයක් සපයන මැණික් නිෂ්පාදනය මෙම වසරේදී ඉතා සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. ඊට නිදසුන් දක්වමින් ඒගැහි වටිනාකමට අනුව ගණනය කළ වටිනා හා අර්ධ වටිනා ගල් අපනයනයන්ගේ ඉපැයීම වසර තුළදී සියයට 16 කින් ඉහළ ගියේය. මිනිරන්, ඛනිජවැලි ඇතුළු අනෙකුත් පතල් අංශයේ නිෂ්පාදනයන්ද 1996 දී ප්‍රසාරණය විය. එසේ වුවත්, මූලිකවම ඉදිකිරීම් අංශය වාර්තා කළ මධ්‍යස්ථ වර්ධනය නිසාවෙන් කැණීම් අංශයේ වර්ධනය මන්දගාමී විය.

කර්මාන්ත නිෂ්පාදන, තේ, රබර් හා පොල් මද නිෂ්පාදන සැකසීම හා කුඩා කර්මාන්ත යන උප අංශයන්ගෙන් සමන්විත නිමැවුම් කර්මාන්ත අංශයේ වර්ධනය 1996 වර්ෂයේදී සියයට 6.5 ක් විය. පසුගිය වසරෙ වාර්තාවුනු සියයට 9.2 ක වර්ධනය හා සසඳන කළ මෙය, මෙම අංශයේ ක්‍රියාකාරීත්වයේ පසුබෑමක් පෙන්වයි. අදාල වර්ෂය තුළදී නිමැවුම් කර්මාන්ත අංශයට අත්විඳින්නට සිදුවුනු අසතුටුදායක තත්ත්වයන් මෙයට මූලික හේතුව වෙයි. 1995 වර්ෂයේදී සියයට 10.2 කින් වර්ධනය වුණු, සමස්ත නිමැවුම් කර්මාන්ත අංශයෙන් සියයට 80 කට වඩා නියෝජනය කරන කර්මාන්ත නිෂ්පාදනවල උප අංශය 1996 සලකුණු කළේ සියයට 7.3 ක මූලික වර්ධනයකි. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සහ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත යන උප අංශයන්ගෙන් හැර අනෙක් සියළුම උප කාණ්ඩයන්හි මෙම වර්ධන උපනතිය දැකිය හැකි විය. ඉහත කී උප කාණ්ඩයන් දෙක 1995 වර්ෂය හා සසඳද්දී 1996 දී ඉතා තියුණු වර්ධන ක්‍රියාකාරීත්වයක් දැක්විය.

පොල් නිෂ්පාදන උප අංශයේ වාර්තා වුනු නිෂ්පාදනයේ තියුණු පහත වැටීම වැවිලි භෝග නිෂ්පාදන සැකසීම් අංශයට ඉතා අයහපත් අන්දමින් බලපෑවේය. කුඩා කර්මාන්ත උප අංශය ද සලකුණු කළේ පසුගාමී වර්ධනයකි. ඒ නිෂ්පාදනයේ ඇති වූ විශාල පසුබෑම ඒ කෙටීමේ කර්මාන්තයට ඉතා අයහපත් අන්දමින් බලපෑ අතර, එය මෙම උප අංශයේ අඩු වර්ධනයට හේතු විය. කර්මාන්ත නිෂ්පාදන උප අංශයේ අඩු වර්ධනයද කුඩා කර්මාන්ත අංශයේ මෙම උපනතිය කෙරෙහි බලපෑවේය.

1995 වර්ෂයේදී වාර්තාවුනු සියයට 4.9 ක ඉහළයාම හා සසඳන කල ඉදිකිරීම් අංශය 1996 දී වර්ධනය වූයේ සියයට 3.4 කිනි. ඉදිකිරීම් අංශයේ පැවති මෙම අඩු වර්ධන උපනතිය තහවුරු කරමින් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති, ඇස්බෙස්ටෝස් හා අනෙකුත් ඉදිකිරීම් අමුද්‍රව්‍ය වෙළඳපලට ගලා ඒමේ අඩුවීමක් දැකිය හැකි විය.

ජල විදුලි උත්පාදනයේ වූ පහත වැටීම පිළිබිඹු කරමින්, විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශය සියයට 2 ක සෘණ වර්ධනයක් දැක්විය. පසුගිය වර්ෂයේ සියයට 10 කින් ඉහළ ගිය ජල විදුලි බල නිෂ්පාදනය 1996 දී සියයට 28 ක තියුණු අඩුවීමක් දක්වමින් ගිගොවොට් පැය 3,249 කට සීමා විය. මේ නිසා ඇතිවූ ඉල්ලුම සපුරාලීම සඳහා, තාප විදුලිය උපරිම ධාරිතාවයෙන් නිපදවුනු බැවින්, එය ගෙගවොට් පැය 972 දක්වා ඉහල ගියේය. ගෙගවොට් පැය 154 ක සැපයුම් හිඟයක් පෞද්ගලික අංශයෙන්

පියවුනි. මීට අමතරව, විවිධ මුදල් සානුබලයන් පිරිනැමීම, විදුලි උත්පාදන යන්ත්‍ර ආයාත කිරීම සඳහා සහනදායී පොලී අනුපාත යටතේ බංකු ණය සැපයීම සහ කර්මාන්තකරුවනට තිරු බදු රහිත විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය කරන්නට අවසර දීම වැනි විවිධ ක්‍රමවලින් පෞද්ගලික අංශයට තම ප්‍රයෝජනය සඳහා විදුලි උත්පාදනය කර ගැනීමට ප්‍රොත්සාහන සලසන ලදී.

ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සංනිවේදන අංශය අනෙකුත් බොහෝ අංශයන් සමග සසඳද්දී සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක විය. මෙම අංශයේ සමස්ත වර්ධනය පසුගිය වසරට වඩා සියයට 7.5 ක් වූ අතර සමස්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට ඉන් වූ දායකත්වය සියයට 11.8 ක් විය. මෙය, පසුගිය වසරේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට වූ දායකත්වය වූ සියයට 11.3 සමග සසඳන විට, මෙම අංශයේ වැඩෙන වැදගත්කම පැහැදිලි කරවයි.

මෙම උප අංශයන් තුන අතුරින් අදාල වර්ෂය තුලදී සැලකිය යුතු ක්‍රියාකාරිත්වයක් පෙන්වන්නේ සංනිවේදන උප අංශයයි. ඊට වඩාත් හේතු වුනේ ටෙලිකොම් ආයතනය මෙන්ම පෞද්ගලික අංශය ද දායක වුනු විවිධ සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ක්‍රියාකාරිත්වයයි. මෙම උප අංශයේ වර්ධනය සෙලියුලර් ජංගම දුරකථන, පේජර් ඒකක (Paging units), වයර් රහිත දුරකථන කුටි, ඉන්ටර්නෙට් ජාලය වැනි විවිධ පහසුකම්හි සිදුවූ ව්‍යාප්තිය මගින් පිළිබිඹු විය. මෙම සේවාවන් භුක්ති විඳින්නන්ගේ සංඛ්‍යාව 1996 දී සියයට 36.4 කින් ඉහළ ගියේය. කෙසේ වුවත්, ටෙලිකොම් වැනි ආයතනවල සේවා ඉල්ලුම් ලේඛනයන්හි සිටින සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යාමෙන් පෙනී යන්නේ තවදුරටත් ප්‍රසාරණය වීමට මෙම අංශයට ඇති ශක්‍යතාවයයි.

කන්ටේනරගත භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩා පහසුකම් සැලසීම වැනි වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් ද 1996 වර්ෂයේදී සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. වරාය තුනෙන් සිදුවූ භාණ්ඩ ප්‍රවාහනයේ සියයට 16.4 කින් ඉහළ ගියේය. වරාය මගින් භාණ්ඩ ප්‍රවාහනයේ වඩාත් තියුණු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන්නේ එම ක්‍රියාකාරකම් සියයට 23.9 කින් වර්ධනය වුනු වසරේ දෙවන භාගයේදීය. මෙම වර්ධනයට හේතුවූයේ මෑත කාලයේ සිදුවුනු වරාය නවීකරණය හා ධාරිතා ප්‍රසාරණය සඳහා වූ විවිධ සංවර්ධන ව්‍යවසායකයින්ය.

දුම්රිය ප්‍රවාහනය, මාර්ග ප්‍රවාහනය හා ගුවන් ප්‍රවාහන ආදියෙන් සමන්විත වන ගමනාගමන උප අංශය 1996 දී සියයට 4.7 කින් වර්ධනය විය. මාර්ග හා දුම්රිය ප්‍රවාහනයින් මෙම වර්ධනයට දායක වූයේ භාණ්ඩ ප්‍රවාහනය හා මගී ප්‍රවාහනය තුළිනි. මගී ප්‍රවාහන අංශය බලන කල ජනතා සන්තක ප්‍රවාහන සේවය අර්ධ සුඛෝපභොගී නගරාන්තර සේවය නම් අළුත් සේවාවක් හඳුන්වා දුන් අතර, ශ්‍රී ලංකා දුම්රිය සේවය අළුත් එන්ජින් ගණනාක් ධාවනයට එකතු කළේය. කෙසේ වුවත්, 1996 වර්ෂයේදී සංචාරකයන්ගේ පැමිණීම අඩුවීම නිසා ගුවන් ප්‍රවාහන සේවය පසුබෑමක් පෙන්විය.

තොග හා සිල්ලර වෙළඳ උප අංශය 1996 වර්ෂයේදී සියයට 5.2 කින් වර්ධනය විය. 1996 වර්ෂයේ මෙම අංශය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 22.6 කින් දායක වුණු අතර, සමස්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට එහි දායකත්වය සියයට 36.0 ක් විය. 1996 මෙම අංශයෙන් වාර්තා වුනු වර්ධනය පෙන්වන්නේ මෙම අංශය පසුගිය වර්ෂයට සාපේක්ෂව වඩා සීඝ්‍රයෙන් ක්‍රියාත්මක වුනු බවයි. මෙම අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ආනයනික වෙළඳාම හා දේශීය වෙළඳාම යන උප අංශයන්ගේ ක්‍රියාකාරිත්වයයි.

1995 වර්ෂයේ වාර්තාවුනු සියයට 10.5 ක වර්ධනය හා සසඳන කළ බැංකු, රක්ෂණ හා නිශ්චල දේපල අංශය 1996 දී වර්ධනය වූයේ සියයට 10.1 කිනි. මෙම අංශයේ එකතුකළ වටිනාකමින් සියයට පනහකටත් වඩා දායකවන විශාලතම උප අංශය වන වාණිජ බැංකු අංශයේ වර්ධනය 1996 වර්ෂයේදී සියයට 8.6 ක් විය. මෙම උප අංශයේ වර්ධනයට වඩාත් බලපෑවේ 1996 දී ආයාත හා නිර්යාත වෙළඳ කටයුතුවල වූ ප්‍රසාරණයයි. මීට අමතරව, පෞද්ගලික හා ආයතන බදු අඩුකිරීමත්, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රසාරණයට වැඩි ප්‍රොත්සාහන සලසමින් ආර්ථික ලිහිල්කරණ ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් මේ සම්බන්ධයෙන් හිතකර ලෙස බලපෑවේය.

1997 වර්ෂයේ සියයට 3.8 කින් ඉහළ ගිය, සමස්ත අංශයේ එකතු කළ වටිනාකමෙන් සියයට 11 කට පමණ දායක වන, රක්ෂණ උප අංශය මෙම වර්ෂයේදී සියයට 9.5 කින් වර්ධනය විය. මෙම අංශයේ වර්ධනයට මූලික වූයේ සාමාන්‍ය රක්ෂණ කටයුතු වලට වඩා ජීවිත රක්ෂණ කටයුතුවල ඇතිවූ ප්‍රසාරණයයි. ප්‍රධාන රක්ෂණ සමාගම් පහ ජීවිත රක්ෂණ කටයුතු

**සංඛ්‍යා සටහන 2.3**
**සම්පත් සංයුතිය හා උපයෝජනය (1982 ස්ථාවර මිල අනුව)**

| ශීර්ෂය | ප්‍රතිශතය | | | | ප්‍රතිශතාත්මක වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1982 | 1994(අ) | 1995(අ) | 1996(අ) | 1995 | 1996 |
| 1. මුළු සම්පත් | 100 | 100 | 100 | 100 | 4.0 | 3.5 |
| වෙළඳ මිල අනුව ද.දේ.නි. | 68 | 66 | 67 | 67 | 5.5 | 3.8 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 32 | 34 | 33 | 33 | 1.0 | 2.9 |
| 2. උපයෝගිකරණය | 100 | 100 | 100 | 100 | 4.0 | 3.5 |
| පරිභෝජනය | 60 | 58 | 59 | 59 | 5.4 | 3.5 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 21 | 17 | 17 | 16 | 1.0 | 2.5 |
| රජය | 3 | 2 | 2 | 2 | 22.7 | 0 |
| රජයේ සංස්ථා හා පෞද්ගලික අංශය | 18 | 15 | 15 | 15 | -1.4 | 2.8 |
| තොග වෙනස්වීම් | 0 | 0 | 0 | 0 | -60.7 | 90.8 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 19 | 24 | 24 | 24 | 2.9 | 3.9 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මගින් ලද ශුද්ධ පාරිතෝෂික ආදායම 1995 වාර්තාකළ රුපියල් බිලියන 2.6 සිට 1996 දී රුපියල් බිලියන 3.1 දක්වා ඉහල යමින් සියයට 22 වර්ධනයක් පෙන්වූ අතර 1996 දී සාමාන්‍ය රක්ෂණ කටයුතු ප්‍රසාරණය වූයේ සියයට 14 කින් පමණකි. කෙසේ වුවත්, ආර්ථික ක්‍රියාකාරිත්වයේ සිදුවූ පසුබෑම රක්ෂණ කටයුතු කෙරෙහිද නරක අන්දමින් බලපෑවේය.

## 2.3 වියදම

පාරිභෝජන වියදමෙන් සහ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙන් සමන්විත වන දළ දේශීය වියදම 1996 වර්ෂය සඳහා රුපියල් බිලියන 836 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, පසුගිය වසරට වඩා එය සියයට 13.3 ක ඉහළ යාමක් වෙයි.

පාරිභෝජන වියදම 1995 සළකුණු කළ රුපියල් බිලියන 566 සමග සසඳන කළ සියයට 15 ක වර්ධනයක් පෙන්වමින් රුපියල් බිලියන 650 ක් ලෙසින් ඇස්තමේන්තු කර ඇත. සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 87 ක් නියෝජනය කරන පෞද්ගලික පරිභෝජන වියදම 1995 දී වාර්තා කළ රුපියල් බිලියන 489 සිට රුපියල් බිලියන 569 දක්වා ඉහල යමින් සියයට 16 කින් වර්ධනය වී ඇත. 1995 වර්ෂයේදී පැවති පරිභෝජන රටාවට වෙනස්ව යමින් දේශීය වශයෙන් නිපදවුනු භාණ්ඩ හා සේවා සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම සියයට 18.5 කින් ඉහල ගිය අතර, ඊට සාපේක්ෂව ආනයනිත භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම ප්‍රසාරණය වූයේ අඩු ප්‍රතිශතයකිනි. (සියයට 11.1 කිනි) දේශීය වශයෙන් නිපදවුනු භාණ්ඩ හා සේවාවන් අතර පොල්, අනෙකුත් ආහාර භෝග හා කාර්මික නිෂ්පාදනයන් සැලකිය යුතු අන්දමේ වර්ධනයක් වාර්තා කල අතර, පෞද්ගලික පරිභෝජන වියදමෙහි සමස්ත ඉහල යාමට ඒවායෙන් වූ දායකත්වය සියයට 65 ඉක්මවීය.

පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙන්ම ආයෝජන වියදම් නියෝජනය දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1996 වර්ෂයේදී සියයට 8.4 ක ඉහළ යාමක් දක්වමින් රුපියල් මිලියන 186,264 ක් වූ බවට ඇස්තමේන්තු කර ඇත. රුපියල් මිලියන 160,644 ක් වූ පෞද්ගලික ආයෝජන වියදම සමස්ත දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට කළ දායකත්වය සියයට 86 ක් විය. 1996 වර්ෂයේ පෞද්ගලික ආයෝජන ක්‍රියාකාරකම්හි දිරිගන්වන සංවර්ධනයක් වන්නේ විදේශීය ආයෝජනයන් සැලකිය යුතු අන්දමින් ඉහළ යාමයි. 1995 වර්ෂයේ රුපියල් මිලියන 1,011 ක් (ඩොලර් මිලියන 10.3 ක්) සෘජු විදේශ ආයෝජන 1996 දී රුපියල් මිලියන 4756 ක් (ඩොලර් මිලියන 59.5) දක්වා ඉහළ ගියේය. අනිකුත් විදේශ ආයෝජනයන්ද 1995 වර්ෂයට සාපේක්ෂව 1996 දී වර්ධනයක් පෙන්වීය. විදේශ ආයෝජන වඩාත් යොමුවූයේ නිමැවුම් කර්මාන්තයන්ට හා සංනිවේදනය, බලශක්තිය, වරාය කටයුතු වැනි පොදු කාර්ය පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහිය. කාර්මික නිෂ්පාදිතයන් අතුරින් මෙම ආයෝජනයන් වඩාත් යොමුවුණේ රෙදිපිළි, ඇගලුම් හා සම් නිෂ්පාදිත වැනි අංශයන් වෙතටය. පාරවල් හැදීම, විදුලිය හා නල වතුර බෙදාහැරීම, දුරකථන හා වරාය පහසුකම් වැනි පොදු කාර්ය පහසුකම් සංවර්ධනය හා නඩත්තු කිරීමට මූලික වශයෙන් වෙන්වුනු රාජ්‍ය ආයෝජන 1996 වර්ෂය සඳහා රුපියල් බිලියන 26 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. කෙසේ වුවත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ ආයෝජනය 1995 දී සලකුණු කළ සියයට 25.7 සිට, ඉදිකිරීම් කටයුතුවල පහත වැටීමත්, ප්‍රවාහණ උපකරණ ආනයනය අඩු මට්ටමක පැවතිමත් නිසා 1996 දී සියයට 24.2 දක්වා අඩු විය.

## 2.4 සම්පත් හා සම්පත් උපයෝජනය

දළ දේශීය නිෂ්පාදිතයෙන් හා සාධක නොවන සේවාවන්වල ආනයනයෙන් (විදේශීය සම්පත්) සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය 1995 දී සලකුණු කළ රුපියල් බිලියන 975 සිට 1996 දී රුපියල් බිලියන 1,106 දක්වා ඉහල ගොස් ඇත. මුළු සම්පත් ප්‍රමාණයෙහි වැඩිවීම වූ බිලියන 131 න් රුපියල් බිලියන 101 ක් පවත්නා වෙළඳපල මිල යටතේ වූ දළ දේශීය නිෂ්පාදිතය ඉහළයාමෙන්ද, ඉතිරි රුපියල් බිලියන 30 විදේශීය සම්පත් වැඩිවීම තුළින් ද ලැබුනි. මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 58.8 ක් පාරිභෝජනය සඳහා ද, සියයට 16.8 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද වෙන්වුනු අතර, ඉතිරි සියයට 24.4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනන් සඳහා යොමු විය.

1995 වර්ෂයේදී සියයට 4.0 කින් ඉහළ ගිය 1982 වර්ෂයේ ස්ථාවර මිල ගණන් අනුව ඇස්තමේන්තු කළ සම්පත් ප්‍රමාණය 1996 දී සියයට 3.5 ක වර්ධනයක් දැක්විය. මූර්ත වශයෙන්, 1995 දී සියයට 5.4 කින් ඉහල ගිය පාරිභෝජන වියදම 1996 දී සියයට 3.5 ක වර්ධනයක් වාර්තා කළ අතර, 1995 දී සියයට 1.0 කින් වර්ධනය වුනු දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ වර්ධනය සියයට 2.5 ක් විය.

**සංඛ්‍යා සටහන 2.4**

**ජාතික ඉතුරුම් (පවත්නා වෙළඳ මිල අනුව)**

| ශීර්ෂය | 1982 | 1994(අ) | 1995(අ) | 1996(අ) |
|---|---|---|---|---|
| 1. වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | 99,238 | 579,084 | 667,772 | 768,934 |
| 2. දේශීය ඉතුරුම් | 11,770 | 88,149 | 102,111 | 119,260 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -1,959 | -8,310 | -6,958 | -11,193 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 5,494 | 30,989 | 34,820 | 39,485 |
| 5. ජාතික ඉතුරුම් | 15,305 | 110,828 | 129,973 | 147,552 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1 හි % ලෙස) | 11.9 | 15.2 | 15.3 | 15.5 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි % ලෙස) | 15.4 | 19.1 | 19.5 | 19.2 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.5 ජාතික ඉතිරිකිරීම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16.8 ක වර්ධනයක් පෙන්වූ දේශීය ඉතිරිකිරීම් 1996 දී රුපියල් මිලියන 119,260 ක් වූ බවට ඇස්තමේන්තු කර ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කල දේශීය ඉතිරි කිරීම් 1995 දී සියයට 15.3 ක් වූ අතර, 1996 දී එය සියයට 15.5 දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් විදේශීයව රැකියා කරන ශ්‍රී ලාංකිකයින් විසින් එවනු ලබන මුදල් වලින් සමන්විත වන ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම වල වටිනාකම රුපියල් මිලියන 39,485 ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 13.4 ක වර්ධනයක් විය. දේශීය ඉතිරිකිරීම් හා ශුද්ධ විදේශීය ආදායම් එකතුවක් ලෙස නිර්වචනය කෙරෙන ජාතික ඉතිරිකිරීම් ද රුපියල් මිලියන 147,552 දක්වා ඉහළ නැගි අතර, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ එය 1996 වර්ෂයේදී සියයට 19.2 ක් විය.